## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 08 දින දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණ අතර ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 නොවැම්බර් 02 දින ඉදිරිපත් කර තිබුණි.

#### 1.2 ගණුදෙනු, මෙහෙයුම් හා කාර්ය සාධනය පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 පිළිතුරු නොලත් විගණන විමසුම්

2012 මාර්තු 31 දින වන විට විගණන විමසුම් 15 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, පිළිතුරු නොලත් විගණන විමසුම්වල කාල විශ්ලේෂණය පහත දැක්වේ.

| | |
|---|---|
| මාස 03 සිට අවුරුදු 01 දක්වා | - 08 |
| අවුරුදු 01 සිට අවුරුදු 02 දක්වා | - 07 |
| | 15 |

### 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

#### 2.1 බැංකු ගිණුම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 395(ඇ) නියමය පරිදි සභාව සතු ජංගම ගිණුම් වෙනුවෙන් 2011 ජනවාරි මස සට බැංකු සැසදුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

#### 2.2 ආදායම් පරිපාලනය

**ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

#### 2.3 නිෂ්ක්‍රිය සම්පත්

2002 වර්ෂයේ විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන යටතේ රු.533,100 ක් වැයකර ඩොලමයිට් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා ඉදිකර තිබූ ගොඩනැගිල්ල එම ව්‍යාපෘතිය ආරම්භ නොකර අත්හැර දැමීම නිසා 2003 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වාම නිෂ්ක්‍රියව පවතී.

---

2.4 **අවිධිමත් ගනුදෙනු**

2011 ජනවාරි 06 දින සභාව විසුරුවා හැර තිබූ අතර සභාපතිවරයාට 2011 ජනවාරි මස දීමනාව වශයෙන් රු. 10,000 ක් ද දුරකථන සහ ඉන්ධන දීමනාවෙන් කොටසක් වශයෙන් රු. 17,648 ක් ද සභා අරමුදලින් ගෙවා තිබුණි.

2.5 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) 2008 වර්ෂයේ උපමාන පාදක ආයෝජන වැඩසටහන යටතේ මිලදී ගෙන මීගහකිවුල ජාතික සවිය ගමනැගුම මෙහෙයුම් කාර්යාලය වෙත ලබාදී තිබුණ රු.380,550 ක් වටිනා උපකරණ අදාල ව්‍යාපෘතිය නිමවී ව්‍යාපෘති කාර්යාලය වසා දැමුණු පසු, ආපසු සභාවට භාරදී නොතිබුණි.

(ආ) ක්‍රියාන්විත රාජකාර් සඳහා යුධ හමුදාවට භාරදී තිබුන සභාවට අයත් කැබ් රථය ආපසු භාරගන්නා ලෙස යුද හමුදාව විසින් වරින්වර සභාව වෙත දැනුම්දී තිබුන නමුත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද එය සභාව වෙත ලබාගෙන අළුත්වැඩියා කර ධාවනයේ යෙදීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) අනතුරකට පත්ව 2008 ජුනි 13 සිට ධාවනයෙන් ඉවත් කර තිබෙන ට්‍රැක්ටර් රථයක් අළුත්වැඩියා කර කසල ප්‍රවාහනයට යොදාගෙන නොතිබුණි.

(ඈ) සභාව සතු ට්‍රැක්ටර් රථයක් 2011 මැයි මස සිට විවිධ පාර්ශවයන්ට විවිධ දෛනික ගාස්තු මත කුලියට ලබාදී තිබූ අතර, ඒ කිසිදු අවස්ථාවක දී විධිමත්ව ලබාදුන් බවට කිසිදු ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් නොවුණි.

(ඉ) ඌව පළාත් පාලන කොමසාරිස්ගේ 2005 මැයි 05 දිනැති සීඑල්ජී/1/ප්‍රා.සභා වාහන චක්‍රලේඛයේ විධිවිධානවල සඳහන් සීමාව ඉක්මවා සභා කැබ් රථය සඳහා ඩීසල් ලීටර් 479 ක් සඳහා සභා අරමුදලින් රු.39,044 ක් වියදම් දරා තිබුණි.